


එක්සත් ජාතීන්ගේ ලෝක පරිසර දිනය නිමිත්තෙන් ඊයේ පැවැති මැරතන් තරගය ක්‍රීඩා හා යෞවන කටයුතු ඇමැති ජීවන් කුමාරතුංග මහතා ආරම්භ කළ අවස්ථාව.

# පරිසර දිනයේ මැරතන් ජය නවරත්න හා මල්ලිකාට

එක්සත් ජාතීන්ගේ ලෝක පරිසර දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකා - එක්සත් ජාතීන්ගේ මිත්‍රත්ව සංවිධානය කළ විවෘත මැරතන් තරගාවලියේ දී නවරත්න විජේසිංහ සහ මල්ලිකා චන්ද්‍රකාන්ති පිළිවෙලින් බාලක බාලිකා සූරතා දිනාගත්හ.

මහා මැරතන් ධාවන තරය ජූනි 06 ද පෙරවරුවේ ගල්කිස්ස, හවුස්වන්ද්‍රා හෝටලය අසලදී තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය ජීවන් කුමාරතුංග මහතා අතින් ආරම්භ වී. කොළඹ - ගාලු මුවදෙර පිටියේදී අවසාන කෙරිනි. ක්‍රීඩක ක්‍රීඩිකාවන් අති විශාල සංඛ්‍යාවක් සහභාගී වූ මෙම මහා මැරතන් ධාවන තරය අවු: 18 න් පහළ බාලක බාලිකා , අවු: 18 න් ඉහළ ගැහැණු/ පිරිමි මෙලස ඉසව් 4 කට බෙදී පැවතුනි.

අනතුරුව කොළඹ, ගාලු මුවදෙර පිටියේදී මෝටර් බයිසිකල් රථ වාහන පෙරටු කොටගත් මහා ජනතා පා ගමනක් ගාලු මුවදෙර පිටිය වටා පැවැත්වුණු අතර ඊට සමගාමීව නව්ක යාත්‍රා සංදර්ශනයක්ද වැපැත්වුණි.

එදින සන්ධ්‍යාවේ කොළඹ නව නගර ශාලාවේ දී කතානායක වී. ජ. මු. ලොකුබණ්ඩාර මහතාගේ ප්‍රධානත්වයෙන් සංස්කෘතිකාංගයන්ගෙන් සපිරි උත්සවයකදී මැරතන් ජයග්‍රාහකයින්ගේ ත්‍යාග කුසලාන සහ සහතික පත් ප්‍රධානය කෙරුණි.

මැරතන් ජයග්‍රාහකයින්

අවු: 18 න් පහළ බාලක, 1. ඒ.පී. නිශාන්ත කුමාර, 2. අමිල මධුසංක, 3. දිනේෂ් ජයරත්න, අවු: 18 න් ඉහළ පිරිමි 1.එම්.නවරත්න විජේසිංහ, 2. රොෂාන් ද මැල්, 3. චමල් වසන්ත, අවු: 18 න් පහළ බාලිකා 1. නදීෂා කුමාරි, 2. ඉන්ද්‍රා දමයන්ති, 3. නදීෂා මිහිරාණි, අවු: 18 න් ඉහළ කාන්තා 1. මල්ලිකා චන්ද්‍රකාන්ති, 2. අමාලි මේනකා, 3. මංචුලා කුමාරසිංහ,